## සූර්ය බල සංග්‍රාම නිවාස දස ලක්ෂ සූර්ය බලාගාර ව්‍යාපෘතිය යටතේ ලංකා විදුලි බල මණ්ඩලය(CEB) හා ලෙකෝ ආයතනය ප්‍රතිලාභීන් වෙත ඉදිරිපත් කරන යෝජනා (මෙම යෝජනා ක්‍රම 3 න් 1 ක් ඔබගේ විදුලි පරිභෝජන රටාව හා කැමැත්ත අනුව තෝරාගත හැකිය)

### 1. ශුද්ධ මණුකරන (Net Metering) ක්‍රමය

වහල මත සවිකරන සූර්ය පැනල මඟින් ජනනය කරන විදුලිය ඒකක ගණන පරිභෝජනය කරන විදුලි ඒකක ගණනට වඩා අඩුනම් එම වෙනසට පමණක් පාරිභෝගිකයා විසින් විදුලිබල මණ්ඩලයට මුදල් ගෙවීම.

(ජනනය කරන ඒකක ප්‍රමාණයේ අතිරික්තයක් ඇත්නම් හිඟ අවස්ථාවන් වලදී හිලව් කිරීමට එම ශේෂය ඉදිරියට ගෙනයාමට හැක. මෙහිදි නිවාස හිමියා අතට මුදල් ලැබීමක් සිදුවන්නේ නැත.)

**වැසි කාල වලදී විදුලි උත්පාදනය අඩු වන නිසා කලින් මාස වල අතිරික්ත විදුලිය වැසි මාස වලදී හිලව් කර ගත හැකි වීම නිසා බොහොමයක් පාරිභෝගිකයන්ට Net Metering ක්‍රමය වඩා යෝග්‍ය වේ.**

### 2. ශුද්ධ ගිණුම්කරණ (Net Accounting) ක්‍රමය

වහල මත සවිකරන සූර්ය පැනල මඟින් ජනනය කරන විදුලි ඒකක ගණන නිවාස හිමියා විසින් පාවිච්චි කරන ලද විදුලි ඒකක ගණනට වඩා වැඩි නම් අතිරික්ත ඒකක ප්‍රමාණය සඳහා විදුලිබල මණ්ඩලය මඟින් පහත වගුවේ සඳහන් පරිදි නිවාස හිමියාට මුදල් ගෙවීම කරයි.

(නිවසේ ජනනය කළ විදුලි ප්‍රමාණය භාවිතා කළ ප්‍රමාණයට අඩුනම් වෙනසට ගෙහිමියා මණ්ඩලයට ගෙවීම් කළ යුතුය.)

**මෙම ගෙවීම් ක්‍රමය වඩාත් යෝග්‍ය වන්නේ අතිරික්ත විදුලි ජනනයක් ඇති නිවාස හා අනෙකුත් ස්ථාන වලටයි.**

**මෙම ක්‍රමය** General Purpose - 1 (GP-1) General Purpose - 2 (GP-2) **සහ** Hotel -1 **කාණ්ඩයන් යටතේ වැටෙන කාර්යාල, ආපන ශාලා, උත්සව ශාලා, සාප්පු ආදියට වඩාත් යෝග්‍ය වේ.**

### 3. නෙට් ප්ලස් ක්‍රමය (Net Plus) ක්‍රමය

වහල මත සවිකරණ සූර්ය පැනල මඟින් නිෂ්පාදනය කරන සම්පූර්ණ විදුලි ඒකක ගණන විදුලිබල මණ්ඩලය විසින් පහත වගුවේ සඳහන් මිල ගණන් පරිදි නිවාස හිමියාගෙන් මිලදි ගෙන ගෙවීම් සිදුකරනු ලබයි.


(නිවසේ බිල්පත් දැනට ගෙවන පරිදිම ගණනය කර ගෙහිමියා විසින් මණ්ඩලයට ගෙවීම් සිදුකළ යුතුය.)

**කර්මාන්තශාලා (Industrial) කාණ්ඩය යටතේ විදුලි බිල්** ගෙවන කර්මාන්ත හිමියන්ට මෙම ක්‍රමය වඩා යෝග්‍යයි.

#### යෝජනා ක්‍රම 2 හා 3 යටතේ ප්‍රතිලාභීන් වෙනුවෙන් ගෙවීම් සිදු කරන ආකාරය

| ගෙවීම් සිදු කරන ආකාරය | ඒකකයකට රු.ශත (kWh) |
|---|---|
| 1. මුල් වසර 7 ට | 22.00 |
| 2. 8 වන වසර සිට 20 වන වසර දක්වා | 15.50 |

## පියෝ ටෙක් ලංකා ඔබට පිරිනමන වාසි




- අප ආයතනය සුනිත්‍ය බලඅධිකාරියේ ලියාපදිංචි වී ඇති නිසා බැංකු ණය පහසුවෙන් ලබා ගත හැකිය.
- ඔබගේ ආයෝජනය සුරක්ෂිත කරන ආකර්ෂණීය මිල ගණන්
- ශ්‍රී ලංකාවේ විදුලි පද්ධතියට අනුකූල වන උසස් ප්‍රමිතියෙන් යුතු ඉන්වේටර් භාවිත කිරීම හා එහි දේශීය නියෝජිතයා වීම.
- සියලුම තත්ව සහතිකයන් ලබා ඇති ප්‍රමිතියෙන් උසස් උපාංග භාවිතය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන සවි කිරීම් .(Installations)
- CEB / LECO සමඟ කෙරෙන ගිවිසුම මනුව සවි කිරීම දක්වා සියලු කටයුතු සම්බන්ධීකරණය .
- අන්තර් ජාතික ප්‍රමිතියෙන්( Standard) හා අනුකූලතාවයෙන් (Compatible) යුතු සූර්ය කෝෂ හා ඉන්වේටර භාවිතය.
- WARANTEE 10-year 25-year: වසර 10 ක පූර්ණ වගකීම සහ වසර 25 ක ක්‍රියාකාරීත්වය පිළිබඳ වගකීම.
- පළපුරුදු විශ්වාසදායී විදුලි කාර්මිකයන් හා විදුලි ඉංජිනේරුවන්ගේ සේවාව.
- සූර්ය කෝෂ හා විදුලි ඉංජිනේරු විද්‍යාව සම්බන්ධයෙන් වෘත්තීය දැනුම හා පළපුරුද්ද.
- **WiFi/GPRS** තාක්ෂණය හරහා සියලුම සූර්යකෝෂ පද්ධති වල ක්‍රියාකාරිත්වය දුර සිට පරික්ෂා කිරීම.
- අලෙවියෙන් පසු විශිෂ්ට සේවාව
- දැනට සිටින තෘප්තිමත් පාරිභෝගිකයන් සමූහය (Satisfied Customer base)

NSB ECO

පරිසර හිතකාමී ණය යෝජනා ක්‍රමය

சூழலை நேசிக்கும் கடன் யோசனை திட்டம்

eco friendly loan scheme


Application for Soorya Bala Sangramaya LECO Loan

| For Office Use Only | |
|---|---|
| LECO- Loan Reference No | |
| LECO- NM Reference No | |
| NSB - Loan Reference No | |

Please mark ✓ in the appropriate boxes or delete inapplicable words

1. Project Type

a. Solar Photo Voltaic

| උපරිම මාසික විදුලි පරිභෝජනය ඒකක ගණන k WH | මාසික බිල රු. | සූර්ය කෝෂ පද්ධතියේ ධාරිතාව kW |
|---|---|---|
| 650 | 25,000/- ට නොවැඩි | 6.00 |
| 600 | 23,000/- ට නොවැඩි | 5.50 |
| 550 | 21,000/- ට නොවැඩි | 5.00 |
| 500 | 18,500/- ට නොවැඩි | 4.50 |
| 450 | 16,000/- ට නොවැඩි | 4.00 |
| 400 | 14,000/- ට නොවැඩි | 3.50 |
| 350 | 12,000/- ට නොවැඩි | 3.00 |
| 300 | 9,000/- ට නොවැඩි | 2.50 |
| 250 | 7,000/- ට නොවැඩි | 2.00 |
| 200 | 5,000/- ට නොවැඩි | 1.50 |

1. සූර්ය කෝෂ පද්ධතියේ ධාරිතාව සහ ඉන්වේටරයේ ධාරිතාවය ඔබගේ අවශ්‍යතාව අනුව වෙනස් කර ගත හැක. පසුකාලීනව සූර්ය කෝෂ පද්ධතිය විශාල කිරීමට අවශ්‍ය නම් ඉන්වේටරයේ අමතර ධාරිතාවක් තිබීම වැදගත්ය.
2. සූර්ය කෝෂ පද්ධතිය මඟින් නිපදවන විදුලිය, දේශගුණය මත හා ඒවා සවිකරන වහලයේ දිශාව සහ ආනතිය අනුව වෙනස් විය හැක.

- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට හා රජයේ වෛද්‍යවරුන්ට **පොලී රහිත** පහසු ගෙවීමේ ක්‍රම.
- ජාතික ඉතිරි කිරීමේ බැංකුව , මහජන බැංකුව, හැටන් නැෂනල් බැංකුව හා සම්පත් බැංකුව ආදී ඔබ කැමති ඕනෑම බැංකුවකින් අවුරුදු 7 කින් හෝ 5 කින් ගෙවීමට අඩු පොලී යටතේ ණය පහසුකම්.
- LECO ආයතනය එහි පාරිභෝගිකයන්ට ජාතික ඉතිරිකිරීමේ බැංකුව හරහා විශේෂ ණය ක්‍රම.


**විමසීම්:**

සමින්ද ජයවර්ධන : 0768299001

ප්‍රමෝද් මධුෂංක : 0768299002

# පියෝටෙක් ලංකා (පුද්) සමාගම

**නො: 134 / E, කටුවාන පාර, හෝමාගම, ශ්‍රී ලංකා**

**දු.අ. / ෆැක්ස් : 0112098666 / 0776461177**

**විද්‍යුත් තැපෑල : info@peotechlanka.com**

**වෙබ් අඩවිය : www.peotechlanka.com**

විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය මෙහෙයවන

# සූර්ය බල සංග්‍රාමයේ නියමුවා

# පියෝටෙක් සමඟ

මුළු දිවයිනම

ජය ගනිමු



**විශ්වාසනීයත්වය** Reliability

**නම්‍යශීලීතාව** Flexibility

**අවංකබව** Credibility

**විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හඳුන්වාදෙන**

## සූර්ය බල සංග්‍රාමය සැකෙවින්

වසර 2050 වන විට ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සම්පූර්ණ විදුලිය ප්‍රමාණය දේශීය/ පුනර්ජනනීය මූලාශ්‍ර වලින් ලබා ගැනීම රජයේ අපේක්ෂාවයි. මේ සඳහා මූලික පියවරක් ලෙස විදුලි පාරිභෝගිකයින් ද විදුලි නිෂ්පාදකයින් වශයෙන් විදුලි ජනන ක්‍රියාවලියට සම්බන්ධ කර ගනිමින් තම නිවෙස්වල වහල මත ඉදි කෙරෙන කුඩා සූර්ය බලාගාර ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් **සූර්ය බල සංග්‍රාමය** නමින් ක්‍රියාවට නංවයි. මේ යටතේ පාරිභෝගිකයින් දස ලක්ෂයක් විදුලි නිෂ්පාදකයින් බවට පත් කිරීමට අපේක්ෂිත අතර, නිෂ්පාදනය කර ජාතික විදුලි බල පද්ධතියට එකතු කරනු ලබන අතිරික්ත විදුලිය සඳහා රජය විසින් ගෙවීමටද නියමිතය. ඕනෑම විදුලි පාරිභෝගිකයෙකුටම මෙම ව්‍යාපෘතිය යටතේ තම **නිවස , වෙළඳසැල, සාප්පු සංකීර්ණය, ආපන ශාලාව, උත්සව ශාලාව හෝ කර්මාන්ත ශාලාව ආදී තැන්වල වහලය, සූර්ය බලාගාරයක්** බවට පත් කල හැකිය.

**මෙම ව්‍යාපෘතියෙන් රටට ලැබෙන වාසි**


- සූර්ය බලය නොමිලේ ලැබෙන බලශක්ති ප්‍රභවයක් බැවින් ගල් අඟුරු සහ පොසිල ඉන්ධන සඳහා වැය වන විදේශ විනිමය රටට ඉතිරි කර ගැනීම.
- පරිසර හිතකාමී සූර්ය බලශක්ති භාවිතය මඟින් වාර්ෂිකව මෙ.ටො. 15,000 පමණ කාබන්ඩයොක්සයිඩ් වායු විමෝචනය වලක්වා ගැනීම මඟින් ගෝලීය උණුසුම අඩුකර ගැනීමට දායක වීම.
- සූර්ය බලාගාර දිවයින පුරා විසිරීමෙන් ජාතික විදුලි බල පද්ධතියේ ස්ථායිතාව තහවුරු කර ගැනීම.
- විදුලි සම්ප්‍රේෂණයේදී හා බෙදා හැරීමේදී සිදුවන බලශක්ති හානි අවම කිරීම
- සෘජු හා වක්‍ර රැකියා දහස් ගණනක් බිහි වීම.
- පරිසර හිතකාමී ජනසමාජයක් බිහි කිරීම.
- අඩු ආදායම්ලාභී පවුල් නව ක්‍රමය යටතේ විදුලි නිෂ්පාදකයන් බවට පත් වීම තුල ආදායම් බෙදී යාමේ විෂමතාවය අවම වීම. (වසර 7 ක් තුල නැවත ගෙවීමේ පදනම මත ක්‍රියාත්මක වන රාජ්‍ය හා පෞද්ගලික බැංකු මඟින් සහනදායී ණය පහසුකම් ලබා ගැනීමට හැක.)


**මෙම සූර්ය බල සංග්‍රාම ව්‍යාපෘතියට දායක වීමෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ**

- විදුලි බිල ශුන්‍ය කර ගැනීම හෝ අවම කර ගැනීමෙන් විදුලි බිලට වියදම් වන මුදල් ඉතිරි කර ගැනීම.
- බොහොමයක් නිවෙස් වල වායු සමීකරණ පද්ධති සවිකර තිබුණත් ඒවා භාවිතා කරන්නේ ඉතාමත් අඩුවෙනි. සූර්ය කෝෂ සවිකර ගැනීමෙන් වායු සමීකරණ හා අනෙකුත් විදුලි උපකරණ රිසි සේ භාවිතයට ඇති බිය තුරන් වේ. .
- අමතර විදුලිය සඳහා ලංවිම මඟින් රු.22/- ක මුදලක් ගෙවන නිසා මීට දායක වීමෙන් අමතර ආදායමක් උපයා ගැනීමට හැකි වීම.
- සූර්ය කෝෂ පද්ධතියක් සවි කර ඇත්නම් විදුලි මිල ගණන් වැඩිවීම පාරිභෝගිකයාට බලපාන්නේ ඉතාමත්ම සුළුවෙනි.
- රජය මගින් ප්‍රතිලාභ 03 ක් යටතේ හඳුන්වාදෙන ගෙවීම් ක්‍රමය නිසා නිවාස, වෙළඳසැල්,සාප්පු සංකීර්ණ, කාර්යාල, හෝටල් හා කර්මාන්ත ශාලා, යන සියළුම ස්ථාන වල සූර්යකෝෂ සවි කර ගැනීමෙන් 22% නොඅඩු වාර්ෂික ප්‍රතිලාභ ලබා ගත හැක. වසර 10 ක පූර්ණ වගකීම සහ නඩත්තු වියදම් ඉතාමත්ම අල්ප නිසා ඔබගේ ආයෝජනය තව දුරටත් සුරක්ෂිත වේ.
- එකවර ආයොජනයක් කර විදුලි බිලෙන් නිදහස් වීම හිතට ලොකු සහනයකි. අලුතින් ඉදිකරන නිවසකට මෙම මූලික පිරිවැය අනෙක් වියදම් හා සැසඳීමේදී සුළු මුදලකි.

## සූර්ය කෝෂ හා ශුද්ධ මනුකරණය (Net Metering) ක්‍රියාකරන්නේ කෙසේද?

හිරු එළිය සූර්ය කෝෂ (Solar Panels) මතට පතිත වූ විට එහි සරල ධාරා(DC) විදුලි බලයක් හට ගනී. එම විදුලිය ඉන්වටරය (Invertor) මඟින් ප්‍රත්‍යාවර්ත ධාරා (AC) විදුලිය බවට හැරී නිවසේ පාවිච්චියට ගැනෙන අතර **අතිරික්ත විදුලිය පමණක්** ලංවිම (CEB) රැහැන් පද්ධතියට ලබා දේ. රාත්‍රී කාලයට අවශ්‍ය විදුලිය හා දිවා කාලයට අවශ්‍ය අමතර විදුලිය (හිරු එළිය අඩු විට) ලංවිම (CEB) මණුව හරහා ලබා ගනී. ලංවිම (CEB) සවි කරණ මණුව (Meter) සූර්යකෝෂ මඟින් ජාතික විදුලිබල පද්ධතියට ලබා දෙන (Export Electricity) ඒකක ගණන හා ඉන් ලබා ගන්නා විදුලි ඒකක ගණන (Import Electricity) ස්වයංක්‍රීයව සටහන් කර ගනු ලබයි. මාසය අවසානයේදි විදුලි බිල ගණනය කරනු ලබන්නේ Import හා Export විදුලි ඒකක ප්‍රමාණය අතර වෙනසටයි.



රූපයේ දක්වා ඇත්තේ සූර්ය කෝෂ සවි කර ඇති පාරිභෝගිකයකුගේ 2015 ඔක්තෝම්බර් මාසයේ විදුලි බිලයි. ඔක්තෝම්බර් 08 සිට නොවැම්බර් 08 දින දක්වා ජාතික විදුලි බල පද්ධතියට ලබා දී ඇති ඒකක ගණන 414 කි (Export). ජාතික විදුලි බල පද්ධතියෙන් ලබා ගෙන ඇති ඒකක ගණන 452 කි. (Import) වැඩිපුර ලබා ගත් ඒකක 38 (452-414)ට රු.174.45 ක බිලක් පමණක් ගෙවීමට ඇත. (එම කාලය තුල නිවසේ සැබෑ විදුලි පරිභෝජනය ඒකක 452 යයි සිතීම වැරදිය. එම කාලය තුල ඉන්වේටරය මඟින් නිපදවූ විදුලි ඒකක ගණනට අමතරව ලබා ගත් ඒකක ගණන එකතු කල විට මුළු පරිභෝජනය ලැබේ.) (565 + 38 = 603 ) මෙම මාසයේ පමණක් ඉතිරිය රු.22,924.05 (රු.23.098.50- රු.171.45)

රූපයේ දක්වා ඇත්තේ සූර්ය කෝෂ සවි කර ඇති පාරිභෝගිකයකුගේ 2016 අප්‍රේල් මාසයේ විදුලි බිලයි. අප්‍රේල් 06 සිට මැයි මස 10 වන දින දක්වා ජාතික විදුලි බල පද්ධතියට ලබා දී ඇති ඒකක ගණන 448 කි (Export). ජාතික විදුලි බල පද්ධතියෙන් ලබා ගෙන ඇති ඒකක ගණන 369 කි (Import). විදුලි බිලට අය කර ඇත්තේ ස්ථාවර ගාස්තුව වූ රු.30/- පමණි. වැඩිපුර ලබා දුන් ඒකක 79 (448-369) ඊළඟ මාසයට රැගෙන ගොස් ඇත. බිලට අනුව මුළු අතිරික්ත ඒකක ගණන 270කි (191+79) වර්ෂා කාලවලදී සූර්ය කෝෂ පද්ධතියේ උත්පාදනය අඩුවන නිසා වැසි කාලයේදීත් මෙම අතිරික්ත ඒකක ගණන ප්‍රයෝජනයට ගත හැකිය. මෙම කාලය තුලදී නිවසේ සැබෑ විදුලි පරිභෝජනය ඒකක 573 කි. ඉන්වටරය මඟින් මෙම කාලය තුල ජනනය කල ඒකක ගණනින් අතිරික්ත ඒකක ගණන අඩු කල විට ලැබෙන අගයයි. (652 -79 = 573 )

